06

# බුදු සසුනේ අග්‍ර දායකයා සහ අග්‍ර දායිකාව

සද්ධා මගේ නැගණියයි. ඇය අපේ පවුලේ බාලයා ය. දිනක් පැවරුමකට පිළිතුරු සොයමින් සිටි ඕ මා ළඟට විත් බුදු සසුනේ අග්‍ර දායකයා හා අග්‍ර දායිකාව කවු ද යි විමසා සිටියා ය. සුදත්ත හෙවත් අනේපිඬු සිටුතුමා බුදු සසුනේ අග්‍ර දායකතුමා බවත් අග්‍ර දායිකාව විශාඛා සිටු දේවිය බවත් ඇයට කියා දුනිමි. ඒ සමග ම මේ දෙදෙනාගේ ජීවන තොරතුරුත් සසුනේ අභිවෘද්ධිය සඳහා කළ සුවිශේෂී මෙහෙයත් ඒ චරිතවලින් ගත හැකි ආදර්ශත් පැහැදිලි කර දීමට මම උත්සාහ ගතිමි.

## අනේපිඬු සිටුතුමා

කෝසල රාජ්‍යයේ අගනගරය වූ සැවැත් නුවර සුමන නම් සිටුවරයෙක් වාසය කළේ ය. ඔහුගේ පුතා සුදත්ත නම් විය. පියාගෙන් පසු ව සිටු තනතුර හිමි වූයේ එම පුතුටයි. තරුණ වියට පැමිණි හෙතෙම මගධ රට රජගහ නුවර සිටුවරයාගේ දියණිය සමග විවාහ විය. ඔහු පියාගෙන් උරුම වූ වෙළෙඳ ව්‍යාපාරවල නිරත විය. එම කටයුතු ධාර්මික ව සිදු කරමින් විශාල ධනයක් උපයා ගැනීමට ද හේ සමත් විය. කාරුණික හදවතකින් හෙබි සුදත්ත සිටුතෙමේ හැකි සෑම විට ම අසරණයින්ට පිහිට විය. අනාථයින් උදෙසා ආහාර පාන පරිත්‍යාග කළේ ය. ඒ නිසා ම ඔහු අනාථපිණ්ඩික හෙවත් අනේපිඬු යන නමින් ප්‍රසිද්ධ විය.

වෙළෙඳ කටයුතු නිසාත් ඥාති සබඳතාව නිසාත් අනේපිඬු සිටුතුමා නිතර රජගහ නුවර සිටු පවුල සමග සබඳතා පැවැත්වී ය. සිරිත් පරිදි ගැල් කණ්ඩායමක් සමග රජගහ නුවර වෙළෙඳාමෙහි නිරත වූ සුදත්ත සිටුතුමා

දිනක් සවස් කාලයේ සිය ඥාති සිටු නිවසට ගියේ ය. එහෙත් එදින රජගහ නුවර සිටුතුමා වෙනදා මෙන් පෙර මගට පැමිණ උණුසුම් ලෙස ඔහු පිළිගත්තේ නැත. සිටු මැදුර ද කලබලකාරී විය. තමන්ට නොදන්වා මංගල උත්සවයක් හෝ වෙන යම් උත්සවයක් හෝ පැවැත්වෙන්නේ ද යන්න සුදත්ත සිටුතුමාට ප්‍රශ්නයක් විය.

අස්වැසිල්ලක් ලද විගස රජගහ නුවර සිටු තෙමේ සුදත්ත සිටුතුමා සමග සතුටු සාමීචි කතා බහට එක්විය. එහි දී සිටුමැදුර තුළ ඇති විශේෂ සූදානම ගැන රජගහ නුවර සිටුතුමා කියා සිටියේ පසු දින බුදු පාමොක් මහා සංඝරත්නය නිවසට වැඩම කරවා දානයක් පිරිනැමෙන බවයි. බුද්ධ යන වචනය ඇසීමත් සමග සුදත්ත සිටුතුමා තුළ උපන්නේ ඉමහත් ප්‍රබෝධයකි. හෙතෙම බුදුරජාණන් වහන්සේ වැඩ සිටින ස්ථානය විමසමින් ඒ මොහොතේ ම උන් වහන්සේ බැහැදැකීමට යාමට අදහස් කළේ ය. මේ වන විට සීත වනයේ බුදුරදුන් වැඩ සිටින නමුදු මුණ ගැසීමට සුදුසු වේලාව නොවන බවත් පසු දින උදය කාලය ඒ සඳහා යොදාගන්නා ලෙසත් රජගහ නුවර සිටුතුමා පැවසී ය. එදින බුදුරදුන් මුණ ගැසීමට යෑමේ ආශාව ආයාසයෙන් මැඩගත් අනේපිඬු සිටුතුමා පසු දින පහන් වන හෝරාව පැමිණෙන තෙක් නොඉවසිල්ලෙන් සිටියේ ය.

එදින රාත්‍රිය ඔහුට දීර්ඝ විය. අවස්ථා ගණනාවක් අවදි ව අඳුර පහ ව ගොස් ඇති දැ යි සොයා බැලුවේ ය. අවසන අඬ අඳුරේ සීත වනය බලා ගමන් කළේ ය. සක්මනෙහි නිරත ව සිටින බුදුරදුන් දුටු අනේපිඬු සිටාණන්ට මහත් ප්‍රසාදයක් ඇති විය. බුදුරජාණන් වහන්සේ "සුදත්ත මෙහි එන්න" යැයි ඔහුට ආමන්ත්‍රණය කළ සේක. බුදුරජාණන් වහන්සේ සමීපයට ගොස් වන්දනා කළ සුදත්ත "ස්වාමීනී සුවසේ සැතපුණු සේක් ද?" යි විමසී ය. ඊට පිළිතුර වශයෙන්,

"කෙලෙස් දුරු කළ බැවින් කාමයෙහි නොඇලුණ නිවී සැනසුණ සිත් ඇති තැනැත්තා සියලු කල්හි ම සුවසේ සැතපෙනවා. සිතේ දුක් පීඩා නැතුව සැනසුණ තැනැත්තා නිතර ම සුවසේ වෙසෙනවා" යනුවෙන් බුදුරජාණන් වහන්සේ කළ ධර්ම දේශනයට සවන් දුන් අනේපිඬු සිටාණෝ සෝවන් වූහ. රජගහ නුවර සිටුතුමාගේ නිවසේ දානයට සහභාගි වී මහත් ගෞරවයෙන් දන් පිළිගැන්වූ අනේපිඬු සිටුතුමා තමන් වෙසෙන සැවැත් නුවරට වස් විසීම සඳහා වැඩමවන ලෙස බුදුරජාණන් වහන්සේට ආරාධනා කළේ ය.

ආපසු සැවැත් නුවරට පැමිණි සිටුතුමා බුදු පාමොක් මහ සඟන සඳහා විහාර මන්දිරයක් ඉදිකිරීමට සුදුසු භූමි භාගයක් සෙවී ය. ඒ සඳහා යෝග්‍ය භූමියක් ඔහුගේ නෙතට යොමු විය. ජේත නම් කුමරුට හිමි එය ලබාගැනීමට සිටුතුමාට විශාල පරිශ්‍රමයක් දැරීමට සිදුවිය. අවසානයේ බිම් කඩ වසා කහවණු ඇතිරීමට එකඟතාවක් ඇති විය. ඒ අනුව සිටුතුමා විසින් සිය භාණ්ඩාගාරයෙන් ගෙනා කහවණු භූමියෙහි අතුරන ලද නමුත් එහි කුඩා කොටසකට ඒවා ප්‍රමාණවත් නොවී ය. සිටුතුමාගේ නිර්ලෝභී භාවය පිළිබඳ ව පැහැදුණු ජේත කුමාරයා එම බිම්කඩ පරිත්‍යාග කළේ ය. ඒ වන විට භූමිය ලබා ගැනීමට සිටුතුමා වැයකර තිබූ මුදල කහවණු දහඅට කෝටියකි.

භූමිය ලබා ගැනීමෙන් අනතුරුව එහි දර්ශනීය ආරාමයක් කරවන ලදි. ජේතවනාරාමය ලෙස එය නම් කරන ලද්දේ ජේත කුමාරයා කළ සුළු පරිත්‍යාගයට කෘතගුණ සැලකීමක් වශයෙනි. එම විහාර කර්මාන්තය සඳහා ද සිටුතුමා කහවණු දහඅට කෝටියක් වැය කළේ ය.

පෙර ඇරයුම පරිදි වස් විසීමට වැඩම කළ බුදුරජාණන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නයට ජේතවනාරාමය සාංඝික කොට පූජා කරන ලදි. ආරාම පූජෝත්සවය ද අති උත්කර්ෂවත් අන්දමින් සිදු විය. ඒ සඳහා වැය කළ මුදල ද කහවණු දහඅට කෝටියකි. ඉඩම මිල දී ගැනීමේ සිට ආරාමය කරවා පූජා කිරීම තෙක් වැයකළ මුළු මුදල කහවණු පනස් හතර කෝටියකි. බුදුරදුන් දිවි ගෙවූ පන්සාලිස් වසක කාලයෙන් දහනව වසක් වස් වාසය කර ඇත්තේ ජේතවන විහාරයේ ය. එහි වැඩ විසූ බුදුරදුන් ප්‍රමුඛ මහා සංඝරත්නයට අවශ්‍ය දන්පැන් ආදිය ඇතුළු ව සියලු පහසුකම් සැපයීම සිදු කරනු ලැබුවේ ද අනේපිඬු සිටුතුමා විසිනි.

සිටු නිවස ද නිරතුරු ව භික්ෂූන් වහන්සේලාට දන්දීම සඳහාත් අනාථ අසරණ පිරිසට සංග්‍රහ පැවැත්වීම සඳහාත් වෙන්වුණි. මේ කරුණු නිසා බුදුරදුන් විසින් අනේපිඬු සිටුතුමා වෙත අග්‍රදායක තනතුර පිරිනමන ලදි. දිනකට දෙවරක් බුදුරදුන් දැකීමට යෑම එතුමාගේ සිරිත විය. බුදුරජාණන් වහන්සේ කෙරෙහි පැවති අධික ගෞරවය නිසා කිසි විටෙකත් දහම් කරුණු විමසීමට එතුමා උත්සාහ නොගත්තේ ය. මෙම අදහස දැන ගත් බුදුරජාණන් වහන්සේ ඔහු පැමිණි සෑම වාරයක ම කිසි යම් දේශනාවක් කළ සේක. බුදුරදුන් බොහෝ සූත්‍ර දේශනා කර ඇත්තේ ද ජේතවනාරාමයේ දී ය. ඒ බව "ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ" යනුවෙන් සූත්‍ර ආරම්භයේ ඇතුළත් සඳහනින් පැහැදිලි වෙයි.

තමා පමණක් නොව සිටු නිවසේ සියල්ලන් ද සැදැහැති බෞද්ධයන් බවට පත් කිරීමට සිටුතුමා කටයුතු කළේ ය. ඒ බව කාල නම් තම පුත්‍රයා දහමට අනුව චරිතවත් පුද්ගලයෙකු බවට පත් කිරීමට සිටුතුමා ගත් උත්සාහයෙන් ප්‍රකට වෙයි.

අනේපිඬු සිටුතුමාට දියණියන් තිදෙනෙකි. ඔවුහු **මහා සුභද්‍රා, චූල සුභද්‍රා** හා **සුමනා** නම් වූහ. මෙයින් චූල සුභද්‍රා හා මහා සුභද්‍රා විවාහ දිවියට පත් වුව ද සෝවන් ව සිටියහ. චූල සුභද්‍රා තමන් විවාහ වී සිටි සිටු පවුල ද බෞද්ධයින් බවට පත් කිරීමට සමත් වූවා ය. යුග දිවියට පත් නොවී නිවසේ දාන ශාලාව භාර ව සිටි සුමනා දියණිය සකෘදාගාමී ව සිටියා ය. අනේපිඬු සිටුතුමා තම බෞද්ධ ජීවන රටාව දරුවන්ට පමණක් නොව මුණුබුරු මිණිබිරියන්ට ද හුරු කළේ ය. බෝනික්කකු කැඩී විනාශ වීම නිසා දැඩි ලෙස සොවින් අඬන මිණිබිරියක සනසාලීමට කළේ බෝනික්කා වෙනුවෙන් දානයක් පිරිනැමීමයි. සේවක සේවිකාවන් ද සැදැහැවත් උපාසක උපාසිකාවන් බවට පත්කරලීමට හෙතෙම කටයුතු කළේ ය. ඒ අතර සිටි පුණ්ණා ශාසනික යුතුකම් නොපිරිහෙලා ඉටුකළ උපාසිකාවක් වූවා ය.

බුදුරදුන් දෙව්රම් වෙහෙරෙහි වැඩ නොසිටි අවස්ථාවල සැදැහැවතුනට වැඳ පුදා ගැනීම සඳහා පූජා වස්තුවක් නොතිබිණි. ඒ අඩුව සපුරාලමින් බෝධි අංකුරයක් රෝපණය කිරීමට අනේපිඬු සිටුතුමා මුල්විය. ආනන්ද මාහිමියන්ගේ මග පෙන්වීම මත රෝපණය කළ බැවින් එය **ආනන්ද බෝධිය** නමින් ප්‍රචලිත විය. එම බෝධීන් වහන්සේ අදටත් ජීවමාන ව වැඩ සිටිති.

මුළු ජීවිත කාලය පුරා ම බුදුරදුන් ප්‍රමුඛ මහා සංඝරත්නය පිළිබඳ ශ්‍රද්ධාවෙන් කටයුතු කළ අනේපිඬු සිටුතුමා සම්බුදු සසුනේ අභිවෘද්ධිය උදෙසා විශාල කැප කිරීමක් කළේ ය. හැකි සෑම විට ම අසරණයින්ට පිහිට විය. වියපත් දිවියේ අවසාන භාගයේ සැරියුත් මාහිමියන්ගෙන් බණ අසා අවසන් සුසුම් හෙලූ අනේපිඬු සිටාණෝ තුසිත දෙව්ලොව උපන්හ.

**අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ අතර පහත සඳහන් ඒවා ද වේ.**

- තෙරුවන් පිළිබඳ ව අචල ශ්‍රද්ධාවෙන් කටයුතු කිරීම
- යහපත් අරමුණු ඉටුකර ගැනීම සඳහා කැපවීම
- උපක්‍රමශීලි ව දරුවන් හා සෙසු පිරිස් සුමගට ගැනීම
- අසරණයින්ට පිහිට වීම
- දැහැමි ජීවන රටාවක් අනුගමනය කිරීම
- ආශ්‍රිතයන් ආගම දහමට නැඹුරු කරවීම
- සුළු පරිත්‍යාගය වුව ද අගය කිරීම, කළගුණ සැලකීම

## විශාඛා මහා උපාසිකාව

අංග ජනපදයේ භද්දිය නුවර විසූ සිටුවරුන්ගෙන් එක් අයෙකි, මෙණ්ඩක සිටුවරයා. ඔහුගේ පුත් ධනංජයගේ හා සුමනා දේවියගේ දියණිය විශාඛාවයි. ඇය ඉතාමත් රූමත් ය; බුද්ධිමත් ය; දෙමාපියනට ළැදි ය; වනිතාවකට යෝග්‍ය ඇවතුම් පැවැතුම්වලින් යුක්ත ය. බුදුරජාණන් වහන්සේ භද්දිය නුවරට වැඩම කළේ ඇය සත් හැවිරිදි වියේ දී ය. ඒ අවස්ථාවේ මෙණ්ඩක සිටුතුමා තම මිණිබිරිය ඇතුළු සම වයස් යෙහෙළියන් බුදුරදුන් දැකීමට යොමු කළේ ය. එදා එම පිරිසට දේශනා කළ ධර්මය අසා විශාඛා දියණිය සෝවන් වූවා ය.

එම වකවානුවේ කොසොල් රජතුමාගේ ආරාධනාවකට අනුව විශාඛාවන්ගේ පියාණන් වූ ධනංජය සිටුතුමා ඇතුළු පවුලේ සැමට කෝසල රාජ්‍යයේ පදිංචියට ඒමට සිදු විය. වාසය සඳහා ඔවුන් තෝරා ගත්තේ සාකේත නුවරයි. විශාඛා දියණිය යොවුන් වියට පත් වූයේ මන නුවන් බඳවන පංච කල්‍යාණයෙන් අනූන රූ සපුවකට හිමිකම් ඇතුව ය. ඇගේ නීල වර්ණ කෙස් කළඹ බොලට දක්වා දික් විය. ඕ තොමෝ කොඳ මල් කැකුළු වන් දත් දෙපෙළ නිසා දන්ත කල්‍යාණයෙන් යුක්ත වූවා ය. වර්ණවත් සිනිඳු සම නිසා ඡවි කල්‍යාණයෙන් ද පොහොසත් වූවා ය. ඕ තොමෝ මාංස හා වයඃ කල්‍යාණයෙන් ද සමන්විත වූවා ය.

පෙර කළ පිනෙන් පංච කල්‍යාණයෙන් යුක්ත වූ මේ සුරූපී ලලනාව තම යෙහෙළියන් ද සමග සාකේත නුවර එක්තරා සැණකෙළියක් නැරඹීමට ගියා ය. අතරමග හදිසියේ ඇතිවූයේ මහ වැස්සකි. යෙහෙළියෝ වැස්සෙන්

නොතෙමී සිටීමට නගර ශාලාවට දිව ගියහ. නමුත් විශාඛා දියණිය වැස්සේ තෙමි තෙමී සුපුරුදු සන්සුන් ගමනින් එම ශාලාවට පසු ව පැමිණියා ය. එහි සිටි බොහෝ දෙනා ඇගේ ගමන් විලාසය දෙස බලා සිටියේ පුදුමයෙනි. විශේෂයෙන් ම එහි රැඳී සිටි බමුණු පිරිසක් ඇය සමග කතා බහට එක් වූහ.



"දියණිය ඔබ කොතරම් කම්මැලි ද? ඔබගේ යෙහෙළියන් වැස්සෙන් ආරක්ෂා වීම සඳහා යුහුසුලු වුව ද ඔබ අලසකම නිසා තෙමුණා නේ දැ"යි ඔවුහු විමසා සිටියහ.

විශාඛාව පැවසුවේ, "පියවරුනි, ඔබට වෙහෙසක් නොවේ නම් එයට පිළිතුරු දිය හැකියි," යනුවෙනි.

"දියණියනි, අපට වෙහෙසක් නැත. අපි එයට කැමැත්තෙන් සවන් දෙන්නෙමු."

එවිට ඇය මෙසේ පිළිතුරු දුන්නා ය.

"පියවරුනි, මෙලොව සිටින සිව් දෙනෙකු මහ මග දිව යෑම අශෝභන වේ. ඔවුහු බොහෝ දෙනාගේ ගැරහුමට ලක් වෙති. එනම්,

සියලු ආභරණවලින් සැරසුණු මහ රජතුමා
සර්වාභරණයෙන් විභූෂිත මංගල හස්තිරාජයා
සංවර ශීලයෙන් යුතු ශ්‍රමණයන් වහන්සේ
සළුපිළි අබරණින් සැරසුණු කුල කුමරිය

යන සතර දෙනා ය. ඕ තවදුරටත් මෙසේ ද පැවසුවා ය. දෙමවුපියන් මා හදාවඩා ගත්තේ බොහෝ බලාපොරොත්තු සිතේ තබා ලොවට වැඩ ඇති දියණියක වේවායි යන උතුම් ප්‍රර්ථනාවෙනි. එහෙයින් පියවරුනි, වැසි පොදකට බිය ව දිව යෑමේ දී මගේ සළුපොට පෑගීමෙන් හෝ ගල්මුල් ආදියක පය හැපීමෙන් හෝ බිම ඇද වැටී අත්පා බිඳී යෑමක් සිදුවුවහොත් මගේ සිරුරේ වටිනාකම ද බිඳී යන්නේ ය. එවිට දෙමාපියන්ට බරක් ව නිවසේ ම විසීමට මට සිදු වන්නේ ය. මේ සියලු කාරණා ගැන සැලකිලිමත් ව, සෙසු අයට වඩා වේගයෙන් දිව යෑමේ හැකියාව පැවැතුණත් එසේ නොකළෙමි. තෙමුණ ඇඳුම් වේළා ගැනීමට ගත වන්නේ සුළු කාලයකි. සිරුරට යම් හානියක් සිදුවුවහොත් එය යථා තත්ත්වයට පත්කර ගැනීමට බොහෝ කාලයක් ගත වෙයි. සමහරවිට ජීවිත කාලයට ම නොහැකි වනු ඇත." මෙම ප්‍රකාශයට කන් දුන් බමුණු පිරිස ඇය පංච කල්‍යාණයෙන් පමණක් නොව නුවණැති බවින් ද අනූන බව වටහාගෙන තමන් ආ කරුණ ඇයට දන්වා සිටියහ.

තමන් සැවැත් නුවර මිගාර සිටුතුමාගේ දූත පිරිසක් බවත් එතුමාගේ පූර්ණවර්ධන නම් වන සිටු පුතුට ආවාහ කර ගැනීමට සුදුසු කුල කුමරියක සොයා ගැනීමේ අපේක්ෂාවෙන් පැමිණි බවත් දන්වා සිටියහ. ඒ ගැන සිටු කුමරියගේ අදහස් විමසන ලදි. ඇය කියා සිටියේ දෙමාපිය කැමැත්ත මත එවැන්නක් සිදුවිය යුතු බවයි. දූත පිරිස පියතුමන්ගේ නම්ගොත් හා මාර්ගය විමසා ධනංජය සිටු මැඳුරට ගොස් තමන් පැමිණි කරුණ සිටු යුවළට සැලකර සිටියහ. එම යුවළගේ කැමැත්ත ලැබීමෙන් අනතුරුව ඔවුහු සැවැත් නුවරට ගොස් මිගාර සිටුතුමාට දැන්වූහ. පසු ව දෙපිරිසගේ ම කැමැත්ත පරිදි විවාහ මංගල උත්සවයට දින නියම කර ගැනිණි.

මංගල උත්සවයට පෙර දින රාත්‍රියේ ධනංජය සිටුතුමා තම දියණියට යුග දිවිය සාර්ථක කර ගැනීම සඳහා වැදගත් උපදේශ 10ක් ලබා දුනි.

1. ඇතුළත ගිනි පිටතට නොදිය යුතු ය.
(තම නැන්දා මාමාගේ හෝ ස්වාමි පුරුෂයාගේ අගුණ හෝ දෝෂ පිට අයට නොකිව යුතු ය)

2. පිටත ගිනි ඇතුළට නොගත යුතු ය.
(තම නැන්දා මාමා හෝ ස්වාමි පුරුෂයා පිළිබඳ ව වටපිටාවේ සිටින අය අගුණ හෝ දොස් කිවහොත් එය ගෙදර අයට නොකිව යුතු ය)

3. දෙන්නන් හට දිය යුතු ය.
(ණයක් දෙන්නේ නම් ආපසු දෙන අයට පමණක් දිය යුතු ය)

4. නොදෙන්නන් හට නොදිය යුතු ය.
(ණයක් ලබාගෙන ආපසු නොදෙන අයට නොදිය යුතු ය)

5. දෙන්නන් හටත් නොදෙන්නන් හටත් දිය යුතු ය.
(දුප්පත් නෑයන් හා මිතුරන් පැමිණ යමක් ඉල්ලුවොත් ආපසු ලැබුණත් නොලැබුණත් දිය යුතු ය)

6. සුවසේ හිඳගත යුතු ය.
(නැන්ද මාමා හා ස්වාමිපුරුෂයා හෝ වෙනත් වැඩිහිටියන් පැමිණෙන විට නැඟී සිටීමට සිදු නොවන පරිදි අසුන් ගත යුතු ය)

7. සුවසේ අනුභව කළ යුතු ය.
(යහපත් භාර්යාවක ලෙස තම නැන්දා මාමා හා ස්වාමිපුරුෂයාට සියතින් ම අහාරපාන පිළිගන්වා නිවසේ සෙසු අයගේ ද අහාරපාන ගැන සොයා බලා තමා අනුභව කළ යුතු ය)

8. සුවසේ නිදා ගත යුතු ය.
(නැන්දා මාමා හා ස්වාමිපුරුෂයාට අවශ්‍ය දේ සපයා දී ඔවුන් නින්දට ගිය පසු ගේ දොර වසා ඇත්දැ යි පරීක්ෂා කොට බලා නින්දට යා යුතු ය. එවිට නින්ද අතරතුර දී අවදි වීමට අවශ්‍ය නොවේ)

9. ගිනි පිරිමැසිය යුතු ය.
(නැන්දා මාමා කෙරෙහිත් සැමියා කෙරෙහිත් ගරුසරු ඇතිව සිටිය යුතු ය. ඔවුන් කෝප කරවීම නුසුදුසු ය)

10. ඇතුළත දෙවියන් පිදිය යුතු ය.
(නැන්දා මාමා හා ස්වාමියා ඇතුළත දෙවියන් ය. ඔවුනට කළ යුතු සත්කාර නොඅඩු ව සිදු කළ යුතු ය)

ඇය මෙම අවවාද තරයේ ක්‍රියාත්මක කිරීමට අදිටන් කරගෙන පසු දින යුග දිවියට පිවිසුණා ය. එදින පියතුමන් තම දියණියට ලබාදුන් තෑගි බෝග අතර විශේෂ ආභරණයක් ද විය. එනම් කහවණු නව කෝටියක් වැයකොට සාදා දුන් මේල පළඳනාවයි. මෙය හිසේ පටන් පහතට විහිදී යන වටිනා පළඳනාවකි. එම පළඳනාව විශාඛාව වැනි ශක්තිමත් කාන්තාවකට හැර වෙනත් අයෙකුට ඉසිලිය නොහැකි බව ද සඳහන් ය. ඊට අමතර ව ඇයට සේවය කිරීමට දැසි දසුන් මෙන් ම උපදෙස් ලබා ගැනීමට උපදේශකවරුන් අට දෙනෙකු ද ලබා දුනි.

පති කුලයට පැමිණි විශාඛා සිටු දියණිය සිය නැදි මයිලන්ට ද මවුපියන්ට මෙන් ගරු සැලකිලි කළා ය. මිගාර සිටු පවුල ජෛන බැතිමතුන් වුව ද විශාඛාව තම ආගම දහම අත් නොහැරියා ය. බුදු බණ ඇසීමට සලස්වා නැදි මයිලන්ට ද බෞද්ධ උපාසක උපාසිකාවන් බවට පත් වීමට මග පෙන්වූවා ය. තමනට නිවැරැදි මාර්ගය පෙන්වා දීම ගැන සතුටට පත් මිගාර සිටුතුමා විශාඛාව තම මෑණියන් සේ සැලකීමට යොමුවිය. එතැන් පටන් ඇය **මිගාර මාතා** නමින් ප්‍රසිද්ධ විය.

ඉතා කෙටි කලක දි ගෘහණියක වශයෙන් විශාඛා සිටු දියණියගේ ආදර්ශවත් ගති පැවැතුම් සැවැත් නුවර සියල්ලන්ගේ ම ගෞරවයට හා ප්‍රශංසාවට පාත්‍ර විය. හැම විට ම වැඩිහිටියෝ තම දරුවනට විශාඛාවන් ආදර්ශයට ගනිමින් හොඳ සිරිත් විරිත් හා යුතුකම් ඉටුකිරීම පුරුදු වන ලෙසට උපදෙස් දුන්හ. ඇය පවුලේ අයට මෙන් ම සේවක සේවිකාවනට ද ගුණගරුක ස්වාමි දියණියක් වූවා ය. හැකි සෑම විට ම උත්සාහ ගත්තේ ඔවුන් බණට දහමට යොමු කිරීමට ය. පෙහෙවස් සමාදන් වූ දිනවල එක් එක් වයස්වල සිටින කාන්තාවන් සමග ධර්ම සාකච්ඡාවල නිරත වූයේ දහම් දැනුම වර්ධනය කරලීමට ය. තිරිසන් සතුන්ට පවා ඇය ආදරය, කරුණාව දැක්වූවා ය.

විශාඛා උපාසිකාව සිදු කළ සුවිශේෂ ශාසනික මෙහෙවර වූයේ තමන් සතු වූ ඉතා වටිනා මේල පළඳනාව මිලකොට සැවැත් නුවර පූර්වාරාමය ඉදිකිරීමයි. සැදැහැවත් කුලුපග දායිකාවක වූ විශාඛාවෝ උදය වරුවේ විහාරයට ගොස් දන් පිළිගැන්වූහ. සවස් කල රෝගී භික්ෂූන් වහන්සේලාට කැඳ හා බෙහෙත් සැපයූහ. විහාරස්ථානයට යනවිට කුඩා භික්ෂූන් වහන්සේලාට ඇය රස කැවිලි රැගෙන ගිය පුවත ද ඉතා ප්‍රකට ය. ඇතැම් විට භික්ෂුණීන් වහන්සේලා සම්බන්ධ ව ඇති වූ යම් යම් ගැටලු නිරාකරණය කිරීමට ද ඕ

මැදිහත් වූවා ය. මේ ආකාරයට විහාරස්ථානය හා පැවති සබඳතා නිසාත් ශාසනික අභිවෘද්ධිය සඳහා කළ සුවිශේෂී කැප කිරීම නිසාත් බුදුරජාණන් වහන්සේ එතුමිය අග්‍ර දායිකා තනතුරට පත් කළ සේක. වසර 120ක් නිදුක් නීරෝගී ව දිවි ගෙවූ විශාඛා උපාසිකාවෝ මරණින් මතු තුසිත දෙව්ලොව උපන්හ.

**විශාඛා උපාසිකාවගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ**

- ගැහැනු ළමයෙකුට ගැළපෙන ඉරියවු පවත්වාගෙන යාම
- දියණියක ලෙස දෙමාපිය උපදෙස් නිසි පරිදි පිළිපැදීම
- බිරිඳක, ලේලියක, මවක ලෙස සිය යුතුකම් හා වගකීම් නිසි පරිදි ඉටු කිරීම
- ධන බලයෙන් හා රූමත්කමින් උඩගු නොවීම
- ආගමට දහමට ළැදි ව කටයුතු කිරීම
- බුද්ධිමත් ව තීරණ ගෙන ක්‍රියා කිරීම
- අලස නොවී කඩිසර ව කටයුතු කිරීම
- වැරැදි මග ගියවුන් සුමගට ගැනීම
- විවාහය නිසා තම ආගම වෙනස් නොකිරීම
- දැනුම බෙදා හදා ගැනීමට යොමු වීම



## සාරාංශය

බුදු සසුනේ අග්‍ර දායකයා ලෙස අනේපිඬු සිටුතුමාත් අග්‍ර දායිකාව ලෙස විශාඛා සිටු දියණියත් බුදුරදුන් විසින් පත් කරනු ලැබුවේ ශාසනික අභිවෘද්ධිය සඳහා එම දෙපළගෙන් සිදු වූ අනුපමේය මෙහෙවර සැලකිල්ලට ගෙන ය. පුද්ගලයෙකු විසින් කරනු ලබන හොඳ වැඩ එම අයගේ මෙලොව ජීවිත මෙන් ම පරලොව ජීවිතය සරුකර ගැනීමට ද උපකාරී වන බව මෙම චරිත අධ්‍යයනයෙන් පැහැදිලි වේ. මෙම පුද්ගල ජීවන තොරතුරු අපගේ සමාජය ගොඩනගා ගැනීමට මෙන් ම චරිත සකස් කර ගැනීමට ද බොහෝ සෙයින් උපකාරී වේ.



## ක්‍රියාකාරකම

1. අනේපිඬු හා විශාඛා චරිත කතාවල ඔබ සිත්ගත් අවස්ථාවක් සැකෙවින් දක්වා එසේ සිත් ගැනීමට හේතු දක්වන්න.

2. ඔබගේ චරිතය හැඩගස්වා ගැනීමට මේ චරිත දෙකෙන් ලබා ගත හැකි ගුණ ධර්ම 5ක් ලියන්න.

3. ජේතවනාරාමයට එම නම් තැබීමට හේතුව පැහැදිලි කරන්න.



## පැවරුම

මෙම පාඩමට අනුව ඇතුළත ගිනි පිටතට ලබා දීමත් පිටත ගිනි ඇතුළට ගැනීමත් නිසා ඇති වන ගැටලු දක්වමින් බෞද්ධ ශිෂ්‍ය සංගමයේ දී ඔබ කරන කතාවට ඇතුළත් කර ගන්නා වූ කරුණු ලියා දක්වන්න.